

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 උඳුවප් මස පුරපසළොස්වක ද<br>ක්‍රි.ව. 2014 දෙසැම්බර් මස 06 වන ද** | **08 වන කලබ** |

# ගුරු දෙව් මාහිමි සඳුනි

පියවර නඟා මෙ සසුන් මඟ දැමිඳුරුව
පිය පිය ගුණෙන් පියකරු වූ ගුරු තරුව
හිය වැඩ පිණිස කැප කළ දිවි පින් සරුව
සිය වස් පුරා සුපිපිණි සියපත ‘යුරුව

ඇසුරින් කලණ ඔවදන් ඔවමින් නිතර
කතරින් එතෙර වන්නට දිරි දෙන අතර
අඳුරින් මුදා නිති අප සුරැකූ පවුර!
සසරින් අපට වේ වා ගුරු දෙව් ඇසුර

**- අනඳ**



# මහණකමේ උතුම්කම

අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල
නායක මාහිමිපාණන් වහන්සේ විසිනි.

ඉතා පෙර එක් පොහොසත් කුලපුත්‍රයෙක් පියුමතුරා බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැද සිටියේ ය. දිනක් උන් වහන්සේ එක්තරා කෙනෙකුන් සැදැහැයෙන් පැවිදි වූවන් අතුරෙහි අගතනතුර තබා වදාළ සේක. හේ එය දැක සතුටු වැ බුදුපාමොක් මහසඟනට සතියක් දන් දී ඒ තනතුර ම පැතී ය. සසර බොහෝ පින්කම් කොට සුගතියෙහි ම ඉපිද මේ බුද්ධෝත්පාදයෙහි කුරුරට ථුල්ලකොට්ඨිත නියම්ගමැ සිටුපවුලෙක උපන. භින්න වූ රටක් පාලනය කරන්නට සමත් වූ කුලයෙක්හි උපන් බැවින් ඔහුට රට්ඨපාල යන නම ලැබිණ. හේ තුරුණු වියට පැමිණ මවුපියන්ගේ අනුමැතියෙන් සුදුසු කුල දුවක ආවාහ කැරගෙන දිවසැපත් බඳු ගිහිසැපත් විඳිමින් විසී ය.

එකල අප බුදුරජාණන් වහන්සේ දනව් සැරිසරනුවෝ ථුල්ලකොට්ඨිත ගමට වැඩි සේක. මේ පුවත දැන රට්ඨපාල සිටුපුත්‍රයා නෑ මිතුරන් සමඟ බණ අසන්නට ගොස් සිත පැහැදී ගියෙන් පැවිදි වන්නට කැමති විය. ඔවුන් තමාගේ මහණකමට බාධා කෙරෙති යි බියෙන් හේ

බණ කෙළවර වූ විට ඔවුන් සමඟ මඳක් දුර ගොස් එක් උපායෙකින් ආපසු එකලා වැ අවුත් බුදුරජාණන් වහන්සේ වැඳ මහණකම අයැදී ය. එවිට තථාගතයන් වහන්සේ, 'මව්පියන්ගෙන් අනුමැතිය ගත්තෙහි දැ'? යි ඔහුගෙන් ඇසූ කල්හි, "නැත ස්වාමීනි"යි කීයෙන් තථාගතයන් වහන්සේ මවුපියන් සමුනොගත් දරුවන් පැවිදි නොකරන බව පැවැසූ සේක. "ස්වාමීනි, මවුපියන් සමුගෙන එමි" යි කියා හේ යළිත් බුදුන් වැඳ සිය මාළිගයට ගියේ ය.

මවුපියනට කාරණය සැළ කළ විට ඔවුහු ඊට තදින් ම විරුද්ධ වූහ. රට්ඨපාල සිටුපුත්‍රයා ඔවුන්ගේ එක ම දරුවා විය. එබැවින් මවුපියෝ ඔහුට මහණවීමට අවසර නො දුන්හ. හේ ඊට නොමනාප වැ නො කා නො බී පැවිදි වන්නට අවසර නො ලැබේ නම් මෙහි ම මැරෙතත් නො නැඟිටිමි යි ඉටාගෙන බිම හොත්තේ ය. මිතුරෝ ද අවුත් ඔහු ගිහිගෙයි රඳවන්නට වෑයම් කළහ. එහෙත් වැඩක් නො වී ය. "පුතණුවන් මළොත් ඔහු දක්නට වත් අපි නොලබම්හ, පැවිදි වුවොත් බලන්නට වත් පිළිවනැ" යි සිතා සත්වන දින මවුපියෝ ඔහුට කථා කොට, 'පුතේ, පැවිදි වැ අප බලන්නට එනු මැනැවැ'යි අයැද අවසර දුන්හ.

හේ මහණ වැ අවුරුදු දෙළසකින් රහත් විය. ඉතින් මේ හාමුදුරුවන් වහන්සේ මේ සස්නෙහි සැදැහැයෙන් පැවිදි වූවන් අතුරෙන් අගතැන් පත් වැ මවුපියන් කෙරෙහි අනුකම්පාවෙන් ඔවුන්ගේ මාළිගයට පිඬු සිඟා වැඩි සේක. එහෙත් පියා වූ සිටුතුමාට තම පුතණුවන් වූ රහතන් වහන්සේ හඳුනාගත නොහැකි විය. ඈත දී ම

උන් වහන්සේ දැක,"මාගේ පුතණුවන් ගෙන ගිය පිරිසෙන් එකෙක් එයි" යන ආදීන් උන් වහන්සේට බැණ වැදුණේ ය. මඳ වේලාවක් බලා සිටිය ද අහරක් නො ලැබිණ. පෙරළා වඩින්නට සිතූ කෙණෙහි එහි ඥාතිදාසියක් පිළුණු කොමු පිඬු (පිට්ටු) ටිකක් ඉවත දමන්නට ගෙන ආවා ය. එය දුටු හාමුදුරුවන් වහන්සේ, " සහෝදරිය, අහක දමන දෙයක් නම් මේ පාත්‍රයට දමනු මැනවැ" යි කියා එය පාත්‍රයට පිළිගෙන පැවිද්දන් සඳහා සාදන ශාලාවකට ගොස් වැළඳූ සේක. කලක් මාළිගයෙහි මෙහෙ කළ ඒ දුප්පත් දසිය අත් පා ආදියෙනුත් කටහඬිනුත් උන් වහන්සේ හඳුනා ගත්තා ය. ඕ වහා ඒ පුවත සිටු දේවියට කීයෙන් සිටුදේවිය එය සිටුහට සැළ කළා ය. සිටාණෝ වහා පුතණුවන් වහන්සේ බලන්නට ගියාහු උන් වහන්සේ පිළුණු කොමු පිඬු වළඳිනු දැක ඉතා කනගාටුවට පැමිණ, එදින දනට ආරාධනා කළහ. ඒ හාමුදුරුවන් වහන්සේ වරක් දන් වැළඳූ බැවින් එය බාර නොගත් සේක. පසු දින ආරාධනය ඉවසා වදරා මවුපියන්ගේ නිවසට වැඩ වදාළ කල්හි ඔවුහු මුන් වහන්සේගේ සිවුරු හරවා නැවතත් ගිහි කරවා ගන්නට උත්සාහ දරූහ. රට්ඨපාල හාමුදුරුන් වහන්සේ එහි දී දන් වළඳා ඔවුනට බණ වදාරා අහසින් කෝරව්‍ය රජුගේ උයනට වැඩි සේක.

මේ රජ රට්ඨපාල හාමුදුරුවන් වහන්සේ ගේ මවුපියන් ගැන හොඳින් දන්නා බැවින් මේ පුවත උයන්පල්ලා කී කෙණෙහි ම එහි ගියේ ය. ගොස් පිළිසඳර පවත්වා ඒ හාමුදුරුවන් වහන්සේගෙන් මෙසේ ඇසී ය "ස්වාමීනි, මෙලොවැ මිනිස්සු කරුණු හතරක් නිසා පැවිදි වෙති. 1. ඇතැමෙක් දුප්පත් වූ විට පැවිදි වෙති. 2. ඇතැමෙක්

මහලු වූ විට පැවිදි වෙති. 3. ඇතැමෙක් ලෙඩදුක් ඇති වූ විට පැවිදි වෙති. 4. ඇතැමෙක් නෑදෑයන් නැති වැ තනි වූ විට පැවිදි වෙති. එහෙත් ඔබ වහන්සේට විශාල ධනයක් තිබුණේ ය. ලෙඩදුක් නොතිබුණේ ය. ඔබ වහන්සේ ඉතා තරුණ ද වන සේක. ඔබ වහන්සේට බොහෝ නෑදෑයෝ ද සිටිති. කවර හෙයින් පැවිදි වූ සේක් ද?" ඉක්බිති රට්ඨපාල මාහිමියෝ, එද මහා කාරුණික බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ බණපද සතරක් අසා තමන් වහන්සේ පැවිදි වූ බව පවසා රජුට අවවාද කළ සේක.

බෞද්ධ ළමයින්ගේ ප්‍රයෝජනය පිණිස ඒ කරුණු සතර සැකෙවින් මෙහි දක්වේ. ගුණවත් භික්ෂූන් වහන්සේ ගේ ආශ්‍රයෙන් විස්තර ලෙස එහි තේරුම උගත මැනැවි.

1. උපනීයති ලොකො අද්ධුවො - මිනිසා මොහොතින් මොහොත මරණයට ළං වෙයි. ජීවිතය අනිත්‍ය යි.

2. අත්තාණො ලොකො අනභිස්සරො - මිනිසාට තුනුරුවන් මුත් වෙනත් පිළිසරණෙක් නැත. පිහිටෙක් නැත.

3. අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයං - මිනිසාට කර්මය මුත් තමාගේ යයි ගත හැකි අන් කිසිවක් නැත. අඹුදරු වතු පිටි කුඹුරු රන් රිදී ගෙරිසරක් ආදි සියල්ල ම මෙහි දමා මැරී පින් පව් පමණක් පොදි ගසා පරලොව යන්නට වේ.

4. ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො - මිනිසාට කොපමණ සම්පත් ලැබුණත් දැන් ඉතින් මට ඇතැ යි නො සිතේ. තව තවත් ආසා කෙරේ. හේ තණ්හාවට දාස වෙයි.

මේ මිහිරි බණ ඇසූ රජතුමා බොහෝ ප්‍රීති විය. ඉතින් පින්වත් ළමයිනි! මේ උතුම් පොහෝ දින බුදු පසේබුදු මහරහතන් විසින් පසස්නා ලද මහණකම ලබාගෙන ලොවට සෙත් සලසන්න ඉටාගන්න. ගිහි ගෙයි කරදර වැඩි ය. සැනැසිලි අඩු ය. විවේක සුඛය නැත. එබැවින් මුළු ලොවට කරුණා මෛත්‍රී කරන්නටත්, හොඳ මඟ කියාදීමෙන් ලොව සනසන්නටත්, පොහොසත්හු නම් කරුණාවත් බහුශ්‍රැත පැවිදි උතුමෝ මැ යි. මේ ගැන තවත් කල්පනා කොට පින්වත් කුලපුත්‍රයෝ රට්ඨපාල හාමුදුරුවන් වහන්සේ මෙන් මවුපියන් සමුගෙන මහණ වැ වෙදකම් ගුරුකම් ආදිය නො කොට ගුණදම් පුරත් වා ! දේශපාලනයටත් රජකමටත් වඩා මහණකම ලක්ෂ කෝටි වාරයක් උතුම් බව අපේ හොඳ බෞද්ධ දරුවන් විසින් සිතට ගත යුතු යි. මුළු දඹදිව රජකම හිමි වූ මිහිඳු කුමරුවෝ ඒ රජකම ඉතා පිළිකුල් කොට මහණකම උතුම් කොට සැලැකූහ. සැරියුත් මා හිමියන් වහන්සේ ද, රට්ඨපාල හාමුදුරුවන් වහන්සේ ද, තවත් සිය දහස් ගණන් උත්තමයන් වහන්සේ ද කෙළ ගණන් ධනය හැර පියා මේ උතුම් බුදුසසුන්හි පැවිදි වූ සේක.

එබැවින් පින්වත් ළමයිනි, මිල මුදල්, උපාධි , ගරු බුහුමන් ආදි ලෞකික දේට ආසා නොකොට පහන් සිතින් පැවිදි වැ ගුණමූර්තියක් වැ මුළු ලොවට සෙත් සලසා නිවන් ලබාගන්නට උත්සාහ දරනු මැනැවි.

හොඳ දරුවනට සුබ - වෙසක් මඟුලක් වේ වා

දරුවෝ මහණ වී හොඳ - හාමුදුරුවරු වෙත් වා!

**(බෞද්ධ ළමයා - 8 කාණ්ඩය 1-2-3 කලබිනි)**



# අපරිහාණිය ධර්ම

**ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසිනි**
**("ධර්මපාල ලිපි" කෘතියෙනි)**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ලිච්ඡවී රජුන්ට වදාරන ලද සප්තාපරිහාණිය ධර්ම මහාපරිනිබ්බාන සූත්‍රයෙහි දක්වා තිබේ. මගධ රටට උතුරින් පිහිටි ලිච්ඡවී වජ්ජීන්ට අයිති වජ්ජී ජනපදය අත්කර ගැනීමට මගධ රට අජාසත් රජ කල්පනා කොට මගධ රට මහාමාත්‍ය වස්සකාර බ්‍රහ්මණයාට ඒ බව කියා තා බුදුරජාණන් වහන්සේ කරා පැමිණ අජාසත් රජුගේ අදහස භාග්‍යවතුන් වහන්සේට ප්‍රකාශ කරන්නට නියම කළේ ය.

කලකට ප්‍රථම භාග්‍යවතුන් වහන්සේ ලිච්ඡවි ජනපදයේ විශාලා අගනුවරට වැඩම කරවා ලිච්ඡවි වජ්ජී කුමාරයින්ට සප්තාපරිහාණිය ධර්ම දේශනා කළ සේක. වස්සකාර බ්‍රහ්මණයා භාග්‍යවතුන් කරා පැමිණ අජාසත් රජුගේ අදහස් ප්‍රකාශ කළේ ය. එ වෙලේ නැවතත් බ්‍රහ්මණයාට ඒ ධර්මය දේශනා කොට " යම්තාක් කල් වජ්ජීහු සමගින් රැස්වීම් ආදි සියලු කටයුතු කරත් ද ඒ තාක් වජ්ජීන්ට අභිවෘද්ධියක් මිස හානියක් නොවන්නේ ය"යි වදාළ සේක. වජ්ජීන්ට දේශනා කරන ලද සප්ත අපරිහාණිය ධර්ම සත මෙකලට සකල බෞද්ධ ස්ත්‍රී පුරුෂ ලොකු කුඩා සිංහලයන් විසින් සිත්හි දරා ගෙන සියලු ක්‍රියා කටයුතුයි.

මේ ධර්ම සත බෞද්ධ පාඨශාලාවල බාලක බාලිකාවන්ට ඉගැන්වීම කටයුතුයි. මේ ධර්ම ලිඛිත කොට හැම පාඨශාලාවල එල්ලා තැබිය යුතු යි. ධර්මාසනාරූඪ වූ භික්ෂු විසින් සප්තාපරිහාණිය ධර්මය, ධර්මය ඇසීමට පැමිණි පිරිසට ප්‍රථමකොට ප්‍රකාශ කටයුතුයි. මේ ධර්ම අන්තර්ගත පත්‍රිකා මුද්‍රණයකොට බෞද්ධයන් අතර විසුරුවා හැරිය යුතුයි. බාල කාලයේ සිට මේ ධර්මයට අනුව පිළිපැදීමට පළමු කොට බෞද්ධ දරුවන්ට දෙගුරුන් ඉගැන්විය යුතුයි. යෑම් ඊම් ඉඳුම් හිටුම් කරන විට මේ ධර්ම ස්මරණය කිරීමට බෞද්ධයන් විසින් සිත්හි දරාගත යුතුයි.

සාරාණීය ධර්ම සය භික්ෂූන් විසින් පුරුදු කටයුතුයි. මේ කාලයට ඕනෑ කරන්නේ මෛත්‍රී වර්ධනයයි. මෛත්‍රී සිතින් කාය වාග් මනෝ කර්ම භික්ෂූන් විසින් හැම කල්හිම කරනු ලැබේ නම් දනට පවතින අසමගිය නැති වේ. මේ කාලයේ භික්ෂූන් සමගියෙන් ඒකීභාවයෙන් සම්මෝදමානයෙන් අවිවාදමානයෙන් ක්ෂීරෝදකීභූතභාවයෙන් සියලු ශාසනික ක්‍රියා කටයුතුයි.

ජාතිමානය තුච්ඡකොට සලකා භික්ෂූහු ක්‍රියා කරත් නම් ලංකා ශාසනය වර්ධනය කළ හැකියි. භාග්‍යවතුන් වහන්සේ ජාතිය, කුලය, ගෝත්‍රය, ප්‍රව්‍රජ්ජාභූමියේ දී විභාග නොකළ සේක.

නාගයාගෙන් විභාග කළ ප්‍රශ්නවල ජාතිය නොවිචාරා ශරීරය සම්බන්ධ නිරෝගී භාවය මුල් කරගෙන රාජනීතියට අනුව ප්‍රශ්න විචාළ සේක. ගංගා යමුනා අචිරවතී ආදී නදී ජලය මහා සමුද්‍රයට වැටුණු කල ඒ නදීවල ජලය වෙන්කර පෙන්වීම නොහැකි ය. එමෙන් ම තථාගත ශාසනයට ඇතුළු වූ පැවිදි භික්ෂූන් ජාතිමානාදියෙන් තොරව නිහතමානීව ක්‍රියා කටයුතුයි.

ලංකාවේ බුද්ධ ශාසනය නිර්මලව පවතිනවා නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර භික්ෂූන් ජාතිගෝත්‍ර පරමාර්ථ කොට සලකන්නේ නැත. සියම් නිකාය, අමරපුර නිකාය, රාමඤ්ඤ නිකාය, කෝට්ටේ නිකාය, එංගලන්ත නිකාය, වැස්ලියන් නිකාය, බැප්තිස් නිකාය, මෙරටෙහි පවතින නමුත් සමගියෙන් ක්‍රියා කරන ඒකායන මාර්ගයේ ගමන් කරන ශ්‍රමණ ධර්ම පූර්ණ ප්‍රියශීලී භික්ෂු ශාසනයක් දකින්නට නැත. එක උර වසන භික්ෂූහු, දෙවුර වසන භික්ෂූහු, පටි බැඳපු භික්ෂූහු, පට කුඩ දරණ භික්ෂූහු, කේශය කොටකර කපා රැවුළ ගාන භික්ෂූහු, හම්බෑග් එක අතින් එල්ලා ගෙන යන බැරිස්ටර් භික්ෂූහු, පිඟන්වල බත් කන භික්ෂූහු, පාත්‍රයේ දන් වළඳන භික්ෂූහු, අධිකරණශාලා, ආපන ශාලාවල හැසිරෙන දුස්සීල භික්ෂූහු, වෙදකම් කරන නැකැත් කියන දුස්සීල භික්ෂූහු, ගිහි තරුණයන්ට වෛද්‍ය ශාස්ත්‍රාදිය උගන්වන දුස්සීල භික්ෂූහු, මිථ්‍යාදෘෂ්ටිය ගත් පයුරුපාෂණය, නොකට යුතු අය සේවනය කරන දුස්සීල භික්ෂූහු, අභිමානයෙන් ''ශ්‍රී'' අක්ෂරය ව්‍යවහාර කරන, ශීලයට වඩා ශ්‍රී අක්ෂරය ව්‍යවහාර කරන භික්ෂූහු, ගිහියන් ඉදිරියේ තබා පඩි පිට සඟරා පත්‍ර කතුකම් කරන භික්ෂූහු, ඇබිත්තයන් නමට රු 4.000 ගණන් බැංකුවේ දමන භික්ෂූහු අද ලංකාවේ දක්නා ලැබෙත්.

දෙදස් වර්ෂයක් පැවතුණ ලංකා ශාසනය අද දවස පිරිහීමට පැමිණ තිබේ. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනේ මත්තඤ්ඤතා ජාගරියානුයෝගමනුයුත්තො'' යන බුද්ධ වචනය ස්මරණය කරන ආභිසමාචාරික පුරණ ආදිබ්‍රහ්මචරියා ශීලය ගරු කරන සිල්වත් භික්ෂූන් පස් නමක් එකතැනට වී එකහිතින් ශාසන දියුණුවට කටයුතු කළොත් ලංකා ශාසනය උද්දීප්ත භාවයට පමුණුවීම පහසුයි.

ගොයිකුල බුද්ධාගම, කරාකුල බුද්ධාගම, හලාගමකුල බුද්ධාගම, දුරාකුල බුද්ධාගම, ගෙරිකුල බුද්ධාගම, මාංශ භක්ෂණ බුද්ධාගම කියා බුද්ධාගමක් නැත. සම්බුද්ධාගම සකල ලෝක වාසීන්ට අයිති බව භාග්‍යවතුන් වහන්සේ විසින් මහා බ්‍රහ්ම රාජයාට වදාළ,

අපාරුතා තේසං අමතස්සද්වාරා
යෙ සෝතවන්තො පමුඤ්චන්තු සද්ධං
යන ගාථාවෙන් ප්‍රත්‍යක්ෂයි.

''මා ජාතිං පුච්ඡ චරණං ච පුච්ඡ'' භාග්‍යවතුන් වහන්සේ භාරද්වාජ බ්‍රහ්මණයාට පිළිතුරු දුන් සේක.

නිර්මල බුද්ධශාසනය ජාති ආගමක් කරගෙන ජාතිවාද ආරම්භ කරගෙන ධර්මය නොදත් විපර්යාස දෘෂ්ටිය ගත් ගිහි පැවිදි දෙකොටස කටයුතු දේ නොකොට ඕනෑ නැති දේ ගැන කාලය ගත කරමින් සිටිති. මේ නිසා බාහිර පබ්බජිත පාසණ්ඩ ආචාරීහු ලංකාවට පැමිණ සිංහල ජාතිය විනාශ කිරීමට කටයුතු කරති. තණ්හා, මාන, විපරීත, දිට්ඨි යන ප්‍රපංචයන් නැතිකර ගැනීමට ශ්‍රමණ ධර්ම නුපුරා ලව්කික දේ ගැන පාප භික්ෂූහු දුශ්ශීලව සිටිති.

අපරිහාණිය ධර්ම සත ද, සාරාණීය ධර්මයන් ද භාවිත කිරීමට ගිහි පැවිදි දෙකොටස විසින් වීර්ය කටයුතුයි. දුර්ලභ වූ මනුෂ්‍යාත්මය ලබාගෙන ප්‍රඥව නොවඩා අපායගාමි මිථ්‍යා ධර්ම වර්ධනය කිරීම දුක්ඛ දයකයි.

ධනං චජෙ යො පන අංගහෙතු
අංගං චජෙ ජීවිතං රක්ඛමානො
අංගං ධනං ජීවිතං චාපි සබ්බං
චජෙ නරෝ ධම්මමනුස්සරන්තො

ධර්මය ශ්‍රේෂ්ඨ බව සළකනු ලැබේවා !



# සියවසක් සුවඳ හැමූ සුසිල්වත් සසුන් කුසුම

**සිරි වජිරාරාම සාසන සාවිකා සමිතියේ ලේඛිකා**
**පුෂ්පා ජයවර්ධන මහාත්මනිය විසිනි**

අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක හාමුදුරුවෝ මෙම උඳුවප් මස 25 වනදා සිය පින්වත් දිවි මගෙහි සිය වන සැතැපුම් කණුව පසු කරති.

1914 දෙසැම්බර් 24 දින මැදියම් රැයෙහි කිතුනුවන් ගේ නත්තල සැමරෙන සීනු හඬ මැද්දේ මහනුවර අම්පිටියේ දී සයිමන් රාජපක්ෂ දම්පතීන් මවුපියන් කොට උපන් පින්වත් ධර්මදාස රාජපක්ෂ දරුවා සොඳුරු තුරුණු වියට පැමිණීමත් සමඟ ම පෙර පින් බෙලෙන් සිය සිත ඇදී ගියේ පැවිදි ජීවිතයක් ගත කිරීම කෙරෙහි ය. ඒ අනුව සිය වැඩි මහල් සොහොයුරා ගේ මෙහෙයීම පරිදි බම්බලපිටියේ වජිරාරාමයට පිවිසෙන්නේ සිය අදහස ඉටු කරගැනීම පිණිස ය.

මාසයක් පමණ වජිරාරාමයේ නතර ව පුහුණුව ලබා 1936 මැයි 06 දින පැවිදි ජීවිතයට පත් වන්නේ සිරි වජිරාරාමාධිපති ව වැඩ විසූ අතිගරු පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් ගේ ආචාර්යත්වයෙනි. ආදර්ශවත් උතුම් ගුරු හිමි නමක ගේ අවවාද අනුශාසනා

යටතේ තමා ගේ නව දිවිය හැඩගස්වා ගන්නට ලැබීම ගැන උන් වහන්සේ තුළ වූයේ අපමණ ප්‍රීතියකි. අතිගරු නාරද මාහිමි, අතිගරු මඩිහේ පඤ්ඤාසීහ නාහිමි, අතිගරු කඹුරුගමුවේ මහානාම මාහිමි, අතිගරු පඹුරන මෙත්තෙය්‍ය මාහිමි වැනි කල්‍යාණමිත්‍ර පැවිදි සහෝදරවරුන් ලැබීම පැවිදි ජීවිතය තව තව ද ආස්වාදකර වූවක් විය.

පැවිදි වී වසර විසි පහක් පමණ උන් වහන්සේ වැඩ විසුවේ සිරි වජිරාරාමයෙහි ය. පහසුකම් අඩු පුංචි කාමරයක වැඩ වසමින්, සිය ගුරු ස්වාමීන් වහන්සේ ගේ උපස්ථානාදි කටයුතු ද මැනැවින් සොයා බලමින්, වජිරාරාම දහම් පාසලේ කටයුතු ද මෙහෙයවමින් උන් වහන්සේ ගේ එ දවස ජීවිතයේ කාලය ගෙවී ගියේ ඉතා සතුටිනි. ඇතැම් දින ගුරු හිමියන් ධර්මදේශනා ආදියට වැඩම කර රෑ බෝ වී වඩින වෙලාවෙහි ද අවදියෙන් සිට ගිලන්පස පිළිගැන්වීම ආදී ගුරු වත් පිළිවෙත් දක්වීම උන් වහන්සේ ගේ සිරිත විය. ඒ කුශල කර්මයේ ඉෂ්ට විපාක අද උන් වහන්සේ මහරගම ධර්මායතනයේ දී ලබන ආකාරය සැබැවින් ම අසිරිමත් ය.

අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ චතුර ඉංග්‍රීසි භාෂා දැනුම නිසාත් උන් වහන්සේ ගේ ප්‍රියංකර පිළිසඳර කථාව නිසාත් ඉංග්‍රීසි කතා කරන (අගනුවර) පවුල්වල දරුවන් දහම් දැනුම ලබා දී හදගැනීම සඳහා යොමු කරන ලද්දේ උන් වහන්සේ වෙත ය. නාරද, මහානාම, මඩිහේ පඤ්ඤාසීහ, පියදස්සි, සෝම, ඛේමින්ද යන හිමිවරුන් නිසා ද වජිරාරාම සෙවණේ ඇසුර සිය දරුවන්ට ලබාදීමට දෙමවුපියෝ දැඩි කැමැත්තක් දැක්වූහ.

1955 දී අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් අපවත් වීමෙන් පසු උන් වහන්සේ ගේ

බලාපොරොත්තුවක් සපිරීම සඳහා, භික්ෂූන් වහන්සේලා පුහුණු කරන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේත් අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමියෝත් දැඩි අදිටනක් ඇති කරගත්හ. 1958 දී මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය උන් වහන්සේලා විසින් ආරම්භ කරන ලද්දේ ඒ පරමාර්ථයෙනි.

භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ ක්‍රමවේදය උන් වහන්සේලාට මැනවින් ම ලැබුණේ අතිපූජ්‍ය පැළෑණේ ගුරු හිමිපාණන් ගෙන් ලත් ශික්ෂණයේ ආභාසයෙනි. ''වජිරාරාම සම්ප්‍රදය'' නම් වූ සුවිශේෂ අනන්‍යතාවක් ඇති ක්‍රම රටාව පුළුල් ලෙස ව්‍යාප්ත කරන්නටත් චිර ජීවනයට පත් කරන්නටත් මෙමගින් ලැබුණු පිටු බලය අති මහත් ය. මහරගම ධර්මායතනය ආරම්භ නොකරන්නට අද වජිරාරාමයත් අනෙක් ශාඛා විහාරස්ථානත් අභාවයට යන්නට බොහෝ කොට ඉඩ කඩ තිබුණි. මෙම සුවිශේෂ සම්ප්‍රදය තුළින් සංඝ සමාජයේ නව පිබිදීමක් ඇති කරන්නට ධර්මායතනයෙන් සිදු වූ සේවාව සිහිපත් කළ යුතු ය. පසු කලෙක අම්පිටියේ මා හිමිපාණන් වහන්සේ ඇති කළ අරණ්‍ය සේනාසන සඳහා වජිරාරාම නාමය ද සම්බන්ධ කිරීමෙන් තම ගුරු භූමියට දැක්වූ ගෞරවය පැහැදිළි වේ.

අම්පිටියේ නායක හාමුදුරුවෝ ව්‍යක්ත ය, විනීත ය, විශාරද ය, බහුශ්‍රැත ය, ධර්මධර ය, ධර්මානුධර්ම ප්‍රතිපන්න ය. උපාධි ආදි කිසිත් නොතිබුණාට ඊට වඩා පුළුල් ව ශාසන මෙහෙවරක් උන් වහන්සේට කළ හැකි වුණේ වජිරාරාමයේ සුවිශේෂ ආභාසය නිසා ය. දෙසුමක් කරන විට වුව ද, ලේඛනයක් සම්පාදනය කරන විට වුව ද, සාමාන්‍ය ජනතාව දෙස බලා ඒවා සරල ව සුගම ව ඉදිරිපත් කිරීමට උන්

වහන්සේ තුළ වූයේ විශේෂ සමත් කමකි. උන් වහන්සේ ගේ මුවින් බණක් අසන විට එය සත්‍ය වශයෙන් ම අප ගේ ජීවිතවලට කරන ඇමතීමක් ලෙස අපට හැඟුණි.

හැම විට ම හැම ඉරියවුවක දී ම පැවිදි අයට පමණක් නොව ගිහි අපට ද පාඩම් උගත හැකි ආදර්ශයක් උන් වහන්සේ වෙතින් ලැබිණි. සමාජය ප්‍රතිසංස්කරණය සඳහා භික්ෂු ජීවිතයෙන් හා භික්ෂු ආකල්පවලින් බොහෝ දෑ කළ හැකි බවට උන් වහන්සේ තහවුරු කොට ඇත.

අතිගරු අම්පිටියේ නායක හාමුදුරුවන් වහන්සේ සිය වසක් පුරා කළ උතුම් සේවාව මෙ බඳු කුඩා ලිපියකින් කෙසේවත් ප්‍රමාණ කළ නොහැකි ය. උන් වහන්සේ එබඳු උත්තරීතර සංඝ පිතෘවරයෙකි. පිය ගුණ සපිරි කාරුණික ගුණයෙන් බැබැළුණු උතුම් ආචාර්යන් වහන්සේ නමකි. ජීවිතයේ විවිධ ගැටලු, දුක් ගිනි ඇතිව පැමිණෙන බොහෝ අයට උන් වහන්සේ ගේ කාරුණික වචනය අමා ඔසුවක් විය. සිය මහණ කමටත් භාවනාවටත් අතිශයින් ඇලුම් කළ උන් වහන්සේ ඒ සඳහා ගිහි-පැවිදි හැම දෙනාට ම දුන්නේ මහත් ධෛර්යයකි.

සාර්ථක උතුම් පැවිදි ජීවිතයක ගුණ සුවඳ විහිදුවමින් සිය වස් විය සපුරමින් වැඩ වසන අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල මාහිමිපාණන් වහන්සේට තෙරුවන් සරණින් නිදුක් නීරෝගී බව හා දීර්ඝායුෂ ඉතා භක්තිමත් ව ප්‍රාර්ථනය කරමු.

**(''සම්භාවනා'' කෘතිය ඇසුරෙනි)**



# නන්දිය මිග ජාතකය


**කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**


සාගරය බඳු ගුණ ඇති අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ තම දෙමාපියන් රැක බලාගත් එක්තරා භික්ෂුන් වහන්සේ නමක් වෙනුවෙන් මෙම ජාතකය වදාළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන්නා වූ කාලයයි. එක් භික්ෂුන් වහන්සේ නමක් සෑම දිනම පිඩුසිඟා වඩින නමුත් දානය වළඳන්නේ නැති බව අනෙක් භික්ෂූහු දැනගත්හ. මෙම භික්ෂුව පිඩු සිඟා ලැබූ දානයට කුමක් කරන්නේ දැයි සිතා කුතුහලයට පත් වූහ. එමෙන් ම දෙව්රම් වෙහෙරට පැමිණෙන උපාසක උපාසිකාවන් පිරිකර ලෙස තමන් වහන්සේට පූජා කරන ලද දේ ප්‍රයෝජනයට නොගෙන දෙමාපියනට ලබා දුන්හ. අනෙක් භික්ෂුන් වහන්සේලා තමන්ගේ කුකුස පිළිබඳව අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ හට පවසා සිටියහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා වදාළේ එම භික්ෂුව පිඬු සිඟා ලැබූ දාන වස්තුව වියපත් මවුපියනට දී සමහර දින නිරාහාරව සිටින බවයි. එමෙන් ම උපාසික උපාසිකාවන් පූජා කරනු ලබන පිරිකරවලින් දෙමවුපියනට

අත්‍යවශ්‍ය ම දේ ලබා දෙන බව තමන් වහන්සේ දන්නා බව පැවසූ සේක. දුකට පත් වී, වියපත් භාවයට පත් වූ දෙමවුපියනට භික්ෂූන් උවටැන් කළ අවස්ථා, පෙර සිට ම පැවති මුත්, එහි වරදක් නොමැති බවත්, බුදුරජාණන් වහන්සේ මෙම නන්දිය මෘග ජාතකය වදරා පැහැදිලි කළ සේක.

යට ගිය දවස සාකේත නම් රටෙහි කෝසල නමින් යුත් රජෙක් රාජ්‍ය කළේ ය. එකල බෝසතාණන් වහන්සේ නන්දිය නම් මුව රජෙකුව ඉපිද, වයස්ගත වූ තම මවුපියනට සළකමින්, මුවන් පිරිවරාගෙන වනයෙහි ජීවත් වූහ. කෝසල රජ මුව මසට ඉතා කැදර විය. ඒ නිසා දිනපතා තමනට මුවකු මරාගෙන එන ලෙස රටවැසියනට අණ කළහ. මේ නිසා ඔවුනට තමන්ගේ රාජකාරි කලට වේලාවට කිරීමට නොහැකි විය. මෙම පාපයට සම්බන්ධවීමට ඔවුහු අකමැති වූහ. ඔවුන් කතිකා කොට රජුට අයත් අංජන නම් වනයෙහි මුවන් ගාල් කොට දී කැමති අයුරින් රජුට දඩයම් කරගන්නට ඉඩ හැරියහ. මුවරජ තම දෙමාපියන් වනයෙහි සඟවා තබා තම මුව රංචුව රැක බලාගනිමින් සිටින අතර දෙමවුපියෝ තමන් දැකීමට එන ලෙස නන්දිය මුව රජ හට සාකේතයට යන මගියකු අත පණිවුඩයක් එවූහ. ඒ මොහොතේම පිටත් නොවූ මුව රජ තම සගයන්ගේ ජීවිත ආරක්ෂා කර දී මවුපියන් දැකීමට යෑමට සිතූහ. එකෙණෙහිම මුව දඩයමට පැමිණී රජ මුව රජු හට දුන්නෙන් විදීමට සැරසුණි. සියලු ම මුවෝ ගැහෙන්නටත්, දුවන්නටත් පටන් ගත්හ. බෝසත් මුව රජ, කෝසල රජු ඉදිරියට පැමිණ අනෙක් මුවන් නොව තමන් මරණයට පත්කරන

ලෙස ඉල්ලා සිටියේ ය. පුදුම වූ රජුට ඇදගත් දුන්න අත හැරීමට නොහැකි විය. මුව රජු, කෝසල රජු හට සතුන් මැරීමේ ආදීනව පැහැදිලි කළ විට, ඔහු සියලු දිය, ගොඩ සතුන් මැරීමේ තහනම් කර මුවන් හට අභය දනය දුන්නේ ය. ධර්මයට අනුව රට පාලනය කළ යුතු බව මුව රජුගේ දහම් දෙසුමෙන් කියැවිණ. ඉන්පසු නන්දිය මුව රජු තම පිරිස සමග වනයට ගොස් මවුපියන් රැක බලාගනිමින් ජීවත් විය.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙම නන්දිය මෘග ජාතකය ගෙන හැර පා දහම් දෙසූ කල කතිකාවතට මුල් වූ භික්ෂුව සෝවාන් ඵලයට පත් විය.

එකල කෝසල රජු ආනන්ද තෙරුන් වූ අතර මගියා සැරියුත් මහරහතන් වහන්සේ ය. මුව රජුගේ දෙමාපියන් සුද්ධෝදන රජතුමා හා මහාමායා දේවියයි. නන්දිය මුව රජ තමන් වහන්සේ ම බව බුදුරජාණන් වහන්සේ වදාළහ.

දෙමාපියන් රැක බලාගත් නන්දිය මුව රජ, එමගින් ලැබූ පින්බෙලෙන් මරණයෙන් බේරුණි. එමෙන් ම දෙමාපියන් පෝෂණය කළ භික්ෂුන් වහන්සේ සෝවාන් වූහ.

වැඩිහිටි බවට පත්වන විට වියපත් වන දෙමවුපියන් රැක බලා ගැනීම අපගේ යුතු කමයි. එමගින් අප රැ ස් කරගන්නා පින්බෙලෙන් අපහට ද ඉදිරියට යහපත් ජීවිතයක් ගත කළ හැකි බව මෙම ජාතකය උගන්වයි. දෙමාපියනට හැකි අයුරින් උපරිමයෙන් සැළකීමට අපි ඉටා ගනිමු.



# සියවසක් සුපිපි සියපත

**(අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ සිය වස් උපන් දිනය නිමිත්තෙනි.)**

**සිරි වජිරාරාමවාසී**
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි.**

මඩ පිරුණු ගොහොරු බිම
දියෙන් මතු වී පිපෙන
සුදු නෙළුම් මල රුසිරු
කවුරු නම් නො දකිද්ද?

සියක් පෙති සුදෝ සුදු
නටුව අග දිලෙන විට
සම කරන්නට සමත්
කුසුම පවසනු කිමැ යි

කෙලෙස් මඩ ගොහොරු ලොව
සුදු නෙළුම සදිසි වී
විකසිත ව සුපසන් ව
ගුරු දෙවිඳු නිහඬ ව ම
පාරමී දම් පුරා
ගුණ සුවඳ විහිදුවයි

සියක් පෙති විලසට ම
සියක් වස් සපුරමින්
දහර සිසු සඟන හට
අවවාද නිති දෙමින්

නිවන් මඟ පෙන්වමින්
කළ මහා මෙහෙවරට
පා කමල් නිති වඳිමි
චිරං ජීවතු ලොකු
සමිඳුනේ.............





# Ampitiye Sri Rāhula Maha Thera

# A veneration to the great teacher

By: **Ven.Tirikunamale Ananda Maha Thera.**

Foremost among the Buddha's disciples of modern Sangha,
Our most Venerable Guru – the one with qualities extraordinary,
An exemplary life, devoted to the practice of the Dhamma
Gives guidance on the Right Path even to the laity

Like fledglings protected under the wings of a mother bird
We were brought up in the shade of your mercy
Kind and gentle words and deeds arising from virtuous thoughts,
Towards the welfare of humanity given most gracefully.

As a great spiritual teacher the highest peak you reached,
Devoted much of your life to discipline and hold us steadfast,
In every aspect of conduct, whether eating, talking, preaching,
Your words were always "heedfulness is  infinitely the best".

A life of simplicity, of holiness, reaching the rare centenary milestone,
Your reverence, your service is unfathomable and timeless,
With offerings of pure lotus blooms at your feet
"Our teacher may you always be in Sansara!" a solemn wish we express.

*The Editor* – **"Bauddha Lamayā "**



# එළ දෙනක් කතා කරයි

විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මි කරුණානායක මහාත්මනිය විසිනි

දරා ගත නොහැකි වේදනාව නිසා මම දෑස් පියා ගත්තෙමි. ටිකෙන් ටික වේදනාව අඩු වේගන මා පාවී යනු දැනුණි. එහෙත් නැවත ඒ වේදනාව දැනේවි යයි බියෙන් දෑස තද කර පියා ගත්තෙමි. යම් කිසි වෙනසක් මට දැනුණෙන් මම දෙනෙත් ඇර බැලිමි.

කෝ මගේ අං, කකුල් හතර ඒ කිසිවක් නැත. දිව සළුවකින් මගේ ගත වැසී ඇත. මම දැන් දෙවඟනක බවට පත් වී සිටිමි. එයින් සතුටට පත් මා එදා මා හට උරුම වී තිබූ සිරුර කොහිදැයි බැලිමි.

එය පිලී ගඳ හමන මස් කඩයක එල්ලෙමින් තිබුණි. මිනිස්සු මුදල් දී ඒ මස් ගනිති.

මම මගේ කුඩා කාලය සිහි කෙළෙමි. ඒ ගම ගෙදර වැස්සියක ලෙස සිටි කාලයයි. රත්තී රත්තී කියමින් කුඩා ළමයි මා සමඟ සෙල්ලම් කළහ. ටික දිනකට පසු මා බැඳ බිම පෙරළා ගිනියම් කළ කූරකින් මගේ ඇගේ අකුරු කෙටුවා. එය හන්වඩු ගැසීම නමින් හඳුන්වනවා. එද මා

විදි වේදනාව ගිනියම් කළ යකඩ කූරෙන් ඇඟ පිලිස්සෙද්දී දැනුණු පුලුටු ගඳ කියා නිම කළ නො හැක. තුවාලයට බෙහෙත් ගැල් වූ නමුත් විටින් විට කුඩා සතුන්ගෙන් පැමිණුණු හිරිහැර අපමණ ය. මම වලිගයෙන් ගසා උන් පලවා හැරියෙමි. වේදනාව නිසා ම මම ගෙපිලේ ලැග උන්නෙමි.

ඒ සමඟම මා දෙසවනට ගුවන් විදුලි ධර්ම දේශනාවක් ශ්‍රවණය විය. ''තිරිසනුන් වෙන්නේ පව් කළාම. එය සතර අපායෙන් එකක්. එයින් මිදෙන්න නම් පින් කරන්න ඕනෑ. අනිත් අය කරන වැරදි හිතන්නේ නැතිව කරන හොඳ දේ ගැන පමණක් හිතා මෙත් වඩන්න.'' ගෙම්බෙක් බණ අසමින් සිටිය දී මිය ගොස් තිරිසන් අපායෙන් මිදී දෙව්ලොව ගිය කතාවකුත් දේශනා කළා.

මමත් සිතුවෙමි. මේ තිරිසන් අපායෙන් මම කොහොම හරි ගැලවෙමි. මේ ගෙදර මිනිසුන් මට හිරිහැර කළාට කන්න බොන්න ඉන්න තැනක් දීලා තියනවා නේ කියා එදා සිට සියලු දෙනාටම මෛත්‍රී කළෙමි. හැකි හැම අවස්ථාවක ම අගු පිලට පැමිණ බණ ඇසුවෙමි.

ටික කලෙකින් මම පිරිපුන් එළදෙනක බවට පත් වීමි. ගෙදර අයට වසු පැටවකු ද ලබා දුන්නෙමි. අනේ ! ඒ පැටියාට අයිති කිරි ටික බුරුල්ලට කට තබා බොන්න හදන විටම ගෙ හිමියා පැටවා එලවා කිරි ටික දොවා ගත්තේ ය. ඒ සුරතල් වසු පැටියාට හන ගැසූ හැටි ලාඩම් ගැසූ හැටි, නහය විද කරත්තේ බැන්ද හැටි අම්මා කෙනෙකු විදියට මා බලා සිටියේ කොපමණ දුකකින් ද?

අම්මා කෙනෙකුගෙන් දරුවා උදුරා ගෙන මේ වගේ අපේ අයිතිවාසිකම් නැති කරන මිනිසුන් ම නේද මානව අයිතිවාසිකම් ඉල්ලන්නේ ! කියා මට සිතිණි.

මේ වගේ දහසක් වද වේදනා මම වින්දෙමි. අපේ ගොම පොහොර කර ගෙන ගෙවත්ත සරු වී ඇත. ඒත් ඒ එළවළු පාත්තියකටවත් කට ගැසීම අපට තහනම්.

අපට තණ කොළ, කොස් කටු, පලතුරු ලෙලි හා පුන්නක්කු දිය කර දෙයි.

මේ කරදර මැද්දේ ඉඩ ලද හැම විටම ගෙපිලට ගොස් ධර්ම දේශනාවලට සවන් දුනිමි. සියලු සත්වයන්ට මෙත් වැඩීමි. ඉඳුම් හිටුම් කෑම් බීම දෙන බව සිතා, මා එසේ කළේ මා මට ම ආදරේ නිසයි. මේ තිරිසන් අපායෙන් බේරෙන්නයි. ටික කලකින් කිරි නැති වැහැරුණු එළදෙනක බවට මම පත්වීමි. දිනක් ගෙහිමියා මා වෙත පැමිණ දැන් අපට මුගෙන් වැඩක් නැහැ. කන්න දෙන එකටත් පාඩුයි. කාට හරි විකුණලා දන්න ඕන යයි කීවේ ය.

පසු දිනක මුදලාලි කෙනෙක් පැමිණ මුදල් ගෙවා මා රැගෙන එන්න සැරසෙද්දී මෙතෙක් කල් මා රැක බලා ගත්තාට පින් කියමින් ඉස්සරා ගාත් දෙක දික් කර වැඳ ගෙදරින් පිටවීමි.

මුදලාලි මා කැඳවා ආයේ ගවයන් මරණ තැනකට ය. මම මුදලාලිට වෛර නොකරමි. මෙත් කරමි. ඒ මා මට ආදරේ නිසයි. මේ තිරිසන් අපායෙන් මා ගළවා ගන්න ආ කෙනෙකු විදියට සිතා මෙත් කෙළෙමි. අසන ලද

ධර්මදේශනා සිහි කෙළෙමි. මිනිසුන්ට ලේ කිරිකර දන් දුන් හැටි ගෙවත්ත සරු කළ හැටි, මා අද මුළු සිරුරම දන් දෙනවා නේද යයි සිතා සතුටු වීමි.

මේ පිනෙන් මම කිසිදින අපායක නො ඉපදෙම්වායි පැතුවෙමි.

ගව ඝාතකයා මගේ ගෙලට තියුණු ආයුධයකින් ගසන විට මට දැනුණු වේදනාව සිරුරින් ගෙල වෙන් වෙනවාත් සමඟ ගලා ගිය රුධිරය, පණ පිටින් මගේ අත පය කපන විට දැනුණු වේදනාව, ඉවසා ගත නො හැකිව දැස් පියා ගත්තෙමි.

මම අද දෙවඟනක්මි. බුදු බණ ඇත්ත මම අද අත්දකිමින් සිටිමි. එදා දැනුණු වේදනාව අද මට නැත. අද මා ලබන සැප හෙට දවසේ නැති වී යා හැකි ය. බුදු බණ අසා මෙත් කොට මම තිරිසන් අපායෙන් මිදුණෙමි.

මෙතැන් සිට මා තෙරුවන් සරණ යමින් බුදු බණ අසමින් සැමට මෙත් කරමින් මේ සසර දුකින් මිදෙන්නට වැර දරමි.

වෙත්වා සව් සත සැම කල් නිදුකී
පත්වා සැපතට බව දුක් වැළකී
යෙත්වා නිවනට සමඟිව මුනිකී
මෙත් බාවන නම් වැඩි පින් කමකී



# King Kosala Spends A Restless Night - Dhammapada V.60

**Compiled by : Mrs. Srima warusawithana.**

On a day of festivity, King Pasenadi Kosala attired in grand regalia
Toured the city astride the white elephant Pundarika,
There beheld a pretty damsel and lustful thoughts arose
Wishing to have her in his harem …
Yet in secret found that the woman is the spouse of another man:
So a plan the King devised, to trap the man for treachery
On false pretense, bound him to serve the King;
The man was ordered a difficult task to bring rare flowers and clay to the King…
Confused and bewildered – for the peasant knew
These rare items were found only in the land of the nagas.
So at break of dawn he took a pack of fresh cooked rice
Sat on the river bank, fed the fish and creatures living there,
Innocently he prayed for some help to accomplish the onerous task….
The nagas took pity on him - the flowers and clay they gathered,
The peasant brought to the King;
The King meantime had spent a sleepless night with lustful thoughts;
Awoke in fear from a dream that made no sense;
To the Buddha, he came and relayed his dream searching for answers.
The Buddha in His unfathomable wisdom spoke thus:
"Long is the night to the sleepless, Long is the way to the weary,
Long is the journey of samsara to the unwise who cannot realize the path."